මෙෝධක ප්‍රශ්නය

සම්පාදක

පූජ්‍ය අකුරේගොඩ රතනසාර හිමි

ශ්‍රී විසුද්ධාරාමය,

බුන්දල, හම්බන්තොට.

තුන් සිත පහදා - වඳිනෙමු පොහොදා

අතු බරවී තුරුලිය හිනැහෙනවා
සුදු මුදු සඳරැස් කිරණ ගලනවා
සේද වළා උඩු වියන් බඳිනවා
විහඟුන් තුති ගී ගයා නටනවා

බොපත් සිලි සිලි ගා හඬවනවා
ගයන ගීතිකා මන පිනවනවා
සුවඳ මලින් බුදු සමිඳු පුදනවා
පින් මහිමය ගන්ටාව කියනවා

සැලෙන පහන් සිලු නෙතේ ගැටෙනවා
අපගේ ජීවිතයට සමවෙනවා
සොඳුරු ලොවක් දුර ඈත පෙනෙනවා
සම්බුදු මාවත එය පෙන්වනවා

වෙහෙරේ රන් කොත දුරට පෙනෙනවා
රැස් මාලා දස අත බබලනවා
සාදුකාර හඬ සවනට එනවා
සම්බුදු මහිමය සිතේ ඇඳෙනවා

මහබෝ රදුගේ සෙවන ලැබෙනවා
දුක සැප පිළිබඳ සිතට නැගෙනවා
සන්සුන් වී සිත සමාදි වෙනවා
මොක්පුර යන්නට මග සලසනවා

හපුවට, පියසෝම ඇතුගලගේ

මෙණ්ඩක ප්‍රශ්නය

පූජ්‍ය අකුරෙගොඩ රතනසාර හිමි

හැඳින්වීම

මෙම ධර්ම ''මිලින්ද ප්‍රශ්නය'' නමැති මහා පොත් වහන්සේගේ සඳහන් ප්‍රශ්න 300කට අධික ප්‍රශ්න අතරින් අංඛ 01 ට තෝරා ගැනීමට හේතු කාරණා පෙරවදනේ සඳහන්ව ඇත. වැඩි විස්තර සඳහා මහා පොත් වහන්සේ කියවා තව තවත් බුඩ දේශනාව ගැන තිබෙන විචිකිච්ඡාවන් නැති කරනගන්න. බුඩ දේශනාව ධර්මය කෙරෙහි ඇතිවන සැකය නොහොත් විචිකිච්ඡාව තව තවත් නිවණ දුරස්වීමක් දුරස්වීමත් සසර දුක වැඩිකර ගැනීමත් පමණක් හේතුවන නිසා මේවා කියවා බලා තේරුම්ගන්න. එනිසා බෞඩයෙනි, නොමග නොයන්න. යහමග ගමන් කරන්න බුඩ දේශනාව තුළින් පෙන්වන්නේ නැවත නැවත ඉපදීම දුකක් නිසා එම දුකින් මිදීමම සැපතකි කියන පණිවිඩයයි. බුඩ ධර්මයෙන් පිට සසර දුකින් මිදීමේ වෙනත් කිසිම මාර්ගයක් නොමැත. කිසිම සැඟවුණ රහසක් නොමැති එකම විවෘත ධර්මය බුදුදහම වීමත් එහි සඳහන් මූලිකම වූ පඤ්චසීලය ආරක්ෂා කිරීමෙන් මෙලොවම ලැබෙන සැනසීමත් සරළ දිවිපෙවෙත් කුරාකුඹියකුටවත් තමා නිසා හිංසාවක් පීඩාවක් නොමැතිවීම නිසාම මරණින් මතු සතර අපා අටමහ නරකාදිවලින් මිදී සුගතිගාමිවීම දක්වාම ලබාදෙන ප්‍රතිඵලයකි. එම නිසා තව තවත් අටුවා ටීකා අවශ්‍ය නැත. ලබාගත් මිනිසත් භාවයත් බුදුසසුනත් පිහිටාධාර කරගෙන දුකෙන් මිදෙන්න.

මීට මෙතැති,
පූජ්‍ය අකුරෙගොඩ රතනසාර හිමි
ශ්‍රී ඥාණාරාම යෝගාශ්‍රමය
කාවන්තිස්ස ගම,
තිස්සමහාරාමය

04-02-2013

(අංඛ 08)

මෙම දහම් ග්‍රන්ථය සම්පාදනය කරණු ලැබුයේ 18-01-2010 දින කොස්ගොඩ දිව්‍යාගල ආරණ්‍ය සේනාසනයෙහි වැඩසිටි කාලය තුළය.

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

(94) මෙණ්ඩක ප්‍රශ්නය

තවද, මෙණ්ඩක නම් ප්‍රශ්නයෙහි ප්‍රාරම්භය දක්වන්නා වූ සියලුම සමය කථාර්ථයක් දක්නා වූ සියලුම තර්ක ශාස්ත්‍රය දන්නා වූ සියලු දෘෂ්ටිවාදීන් මර්දනය කරන විශේෂ ප්‍රඥාවක් ඇත්තා වූ සියලු කුශලා කුශල ධර්මයන්ගේ විපාක දැනීම හා ස්ථානෝචිත ප්‍රඥාව ඇත්තා වූ සතර සංග්‍රහ වස්තුවෙන් ජනරඤ්ජන කරන්නා වූ මිළිඳු නම් නරේන්ද්‍ර රජතුමා තීක්ෂණ වූ ප්‍රශ්න විචාරා නාගසේන ස්ථවිරයන් වහන්සේගේ නුවණ නැති කරණු පිණිස එම ස්ථවිරයන් වහන්සේ වෙත තර්කවාදයෙන් පැමිණියේය. රජතුමා ස්ථවිරයන් වහන්සේගේ සෙවනැල්ල මෙන් ගැවසෙමින් ඇසූ අර්ථ නැවත නැවතත් විචාරමින් සිටින බැව් සියලු දෙව් මිනිසුන් අතර ප්‍රචලිත වූහ. මෙම රජතුමා සියලුම සූත්‍ර පිටක ජාතක කතා වස්තු ථේර ථේරි ගාථා ආදි බුධ දේශනාවන් සියල්ලක්ම කියවා දැන අවබෝධ කරගෙන මෙවන් සිතිවිල්ලක් ඇතිකර ගත්තේය.

අනාගතයේදී අල්පබුද්ධීන් විසින් අවුල් හැර මුදාලිය නොහැක්කා වූ එම හේතුව මත දෘෂ්ටිවාදීන් විසින් කරන නිග්‍රහ සහිත වූ 'මෙණ්ඩක' නම් ප්‍රශ්නයක් දුටුවේය. බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි පර්‍යායෙන් වදාළ ධර්මයෝත් ඇත. යම් දෙයක් උදෙසා වදාළ ධර්මයෝත් ඇත. ස්වභාවයෙන් වදාළ ධර්මයෝත් ඇත. දේශනාවෝත් ඇත. ඒ ඒ ධර්මයන්ගේ අර්ථය තත්වූ පරිද්දෙන් නොදැනීම හේතුකොට ගෙන අනාගතයෙහිදී ඒ මෙණ්ඩක සර්වඥ වචනයෙහි අන්‍ය දෘෂ්ටිවාදීන්ගේ විග්‍රහයකුදු වන්නේ වී නම් නපුරකි. එමනිසා මම සදා පූජනීය නාගසේන මහා ස්ථවිරයන් වහන්සේ පහදවා ගෙන මෙණ්ඩක නම් ගැටළු අවුල් සිඳහරිමි. ඒ නාගසේනයන් වහන්සේ විසින් දක්වන ලද නිරවුල්

මාගීයෙන් අනාගතයෙහි ධර්ම කථිකයෝ අර්ථ ධර්ම ලොවට දක්වති'යි සිතුහ. මෙලෙස සිතා ඉක්බිති මිළිඳු රජතුමා අරුණෝදය නැගුනු කල්හි නා පිරිසිදු වී අතීත වර්තමාන අනාගත සියලුම බුදුරජාණන් වහන්සේලා සිහිපත් කර ඈ මෙවෙලේ පටන් සත්දවසක් ගෙවෙන තෙක් අටසිල් සමාදන්ව තපස්වර දිවිපෙවෙතකින් හැසිරිය යුතුය. පුරුදු පුහුණු කරන ලද තපස්දම් ඇති මම ඒ උතුම් වූ නාගසේන ආචාරින් වහන්සේගෙ සිත් දිනාගෙන පැවිදි ශ්‍රමණ භික්ෂූන්ටම සුදුසු රහස් කථාවක් වූ 'මෙණ්ඩක' නම් වූ ප්‍රශ්නය විචාරමි'යි සිතා අටසිල් සමාදන් වූහ.

ඉන් අනතුරුව රජතුමා සියලු රාජාභරණ සහ රාජවස්ත්‍ර ඉවත්කර කහ වස්ත්‍ර ඇඳ පෙරවාගෙන එවන්ම කුඩා වස්ත්‍රයකින් හිස වසාගෙන මුණිභාවයට පැමිණ අෂ්ටවිධ වූ ගුණධර්මයන් සමාදන් වෙමින් මෙම දවස් හතම මම රාජ්‍යාර්ථය අනුශාසනා නොකොට යුතුය. කාම රාග සිතක් ඇතිකර නොගත යුතුය. කෝප සිතක් ඇතිකර නොගත යුතුය. මාන්නය සහිත සිතක් ඇතිකර නොගත යුතුය. සියලුම සේවකයන් කෙරෙහිත් යටහත් පහත් සිතක්ම ඇතිකර ගත යුතුය. සිත, කය, වචනය ආරක්ෂා කර ගත යුතුය. හාත්පසින් ඇස-කණ-නාසය-දිව-ශරීරය-සිත කෙළෙස් සතුරන්ගෙන් ආරක්ෂා කර ගත යුතුය. සිත නිරන්තරයෙන්ම මෛත්‍රී සහගතවම තබාගත යුතුය'යි සිතා දවස් හතම නුවරින් පිටතට නොගොස් අටවැනි දවස ඉක්ම වූ පසු පෙරවරු ආහාර පාන කටයුතු නිමකර සන්සුන් ඉරියව්වෙන් සතුටු සිතින් නික්ම නාගසේන මහ තෙරුන් වෙත ගොස් දොහොත් මුදුනේ තබා වැඳ එකත් පස්ව ඉඳ මෙසේ සැළකළහ.

''ස්වාමීනි, නාගසේනයන් වහන්ස, මෙම ගෞතම බුද්ධ ශාසනයෙහි ගුරුවරයා විසින් තම අතවැසියා නොහොත් ගෝලයා කෙරෙහි නිරන්තරයෙන් යහපත් කොට ආරක්ෂා තැබිය යුතුය.

(1) අසේවනාචයො දැන ගත යුතුය.

(2) ප්‍රමාද අප්‍රමාද දැන ගත යුතුය.

(3) නින්ද දත යුත්තේය.

(4) ගිලන් බව දත යුත්තේය.

(5) ආහාරය ලත් නොලත් බව දත යුත්තේය.

(6) ශ්‍රද්ධා වීර්‍ය්‍ය බහුශ්‍රැතනාදි පුද්ගල විශේෂය දත යුත්තේය.

(7) පාත්‍රයට ලත් දෙයක් දිය යුත්තේය.

(8) භය නොගනුව තොපට අර්ථ ඉගෙණීම වර්ධණය වන්නේය'යි කියා අස්වසාලිය යුත්තේය.

(9) මෙනම් පුද්ගලයා සමග හැසිරෙන්නේය'යි කියා හැසිරීම දත යුත්තේය.

(10) ගමෙහිදි හැසිරීම දත යුත්තේය.

(11) විහාරයෙහිදී හැසිරිය යුතු ආකාරය දත යුත්තේය.

(12) ඒ අතවැසියා සමග මොනයම් අවස්ථාවකවත් අල්ලාප සල්ලාප නොකට යුත්තේය.

(13) ඔහුගේ වරදක් දැක නොකිපී ඉවසිය යුතුය.

(14) කරණ සත්කාරයක් නියමාකාරයෙන්ම නිම කළ යුත්තේය.

(15) උගන්වන ශිල්ප ශාස්ත්‍ර ධර්‍මයන්ගෙ අඩාල නොකිරීමෙන් සහ කරණ සත්කාරයෙන්ම අඛණ්ඩකාරී විය යුත්තේය.

(16) රහස් වැඩ කිසිවක් නොවිය යුතු.

(17) නිරවශේසකාරී නොවිය යුත්තේය. (ගුරු මුෂ්ටිය නොහොත් ගුරුවරයාට විශේෂ බලවක් වශයෙන් කිසිවක් ඉතිරිකර ගත යුතු නොවේ.)

(18) මොන ආකාරයකින් මොහු ශිල්පයෙහි උපදවම්දොහො'යි කියා ජනක චිත්තය ඉපදවිය යුත්තේය.

(19) කෙසේ නම් මොහු ශීලාදී ගුණයෙන් නොපිරිහෙත්දො'යි කියා වර්ධන සිත ඉපදවිය යුත්තේය.

(20) මොහු ශික්ෂා බලයෙන් බලවත් කෙරෙමි'යි කියා චිත්තය

උපදවා ලිය යුත්තේය.

(21) මෛත්‍රී සිත උපදවා ලිය යුත්තේය.

(22) කරදරයක්, ආපදාවක් පැමිණි කල්හි නොහැරිය යුත්තේය.

(23) යම්කිසි අවශ්‍යතාවයක් පැමිණි කල්හි 'මට මොකද?'යි සිතා ප්‍රමාද නොවිය යුත්තේය.

(24) සිත චඤ්චල වූ කල්හි ධර්මයෙන් පිහිට විය යුත්තේය.

(25) ගුරුවරයා විසින් අන්තේවාසිකයා කෙරෙහි නිරන්තරයෙන් යහපත් කොට ආරක්ෂා තැබිය යුතුය.

''ස්වාමීනි, මෙකී පස්විසි ගුණයෝ ආචාර්‍යවරයාගෙ, ආචාර්‍ය ගුණයෝය. එම ගුණයෙන් මා කෙරෙහි යහපත් කොට පිළිපැද වදාළ මැනව'' තවද ස්වාමීනි, මම කාංක්ෂාවක් උපන්නේය. සර්වඥභාෂිත වූ මෙණ්ඩක නම් ප්‍රශ්න ධර්මයෝ ඇත. අනාගත කාලයෙහි එම ධර්ම දේශනාවෙහි දෘෂ්ටිවාදීන්ගෙ කලහ විග්‍රහයක් උපන්නේය. ඒ කලියුග කාලයෙහි ඔබ වහන්සේ වැනි වූ මහා බුද්ධිමතුන් වහන්සේලා දුර්ලභ වන්නාහුය. එම නිසා පරවාදීන්ට නිග්‍රහ කරනු පිණිස මාගේ ඒ ප්‍රශ්න ධර්ම දේශනාවන් කෙරෙහිලා නුවණ ඇස පිරිසිදු කොට දෙවා වදාළ මැනව'යි කියා ආරාධනා කළහ.

එකල්හි පරවාදිභකුම්භවිදාරණකේශරීන්‍රභූත වූ නාගසේන ථෙරසාමීන් වහන්සේ'' යහපත, මහ රජාණෙනි'යි වදාළා. එපවත් පිළිගෙන තුණුරුවන් ආශ්‍රය කරණ උපාසකයාගෙ උපාසක ගුණ දහයක් පෙන්වා වදාළ සේක.

''මහරජතුමනි, උපාසකයාගෙ උපාසක ගුණයෝ දහය කෙසේද?යත් :- මහරජතුමනි, බුඬ ශාසනයෙහි උපාසක තෙම සංඝයා වහන්සේ හා සමාන වූ සුවඳක් කැමතිවේද, ධර්මයට ආදිපත්‍යකොට ඇත්තේද, ශක්ති පමණින් පූජා කටයුතු කෙරෙහි වසන්නේ වේද, බුදු සසුනේ පිරිහීම දැක එහි අභිවෘද්ධිය පිණිස

උත්සාහ කරන්නේය. සම්‍යක් ප්‍රතිපත්තියෙහි හැසිරීමෙන් සම්‍යක් දෘෂ්ටික වේද, පහ කරන ලද කොතුහලමංගලික නම් විපරීත දෘෂ්ටිව්‍රත සමාදානාදී මංගල ක්‍රියාවන් ඇත්තේ ජීවිතය ගියත් වෙනත් ශාස්තෘ කෙනෙකුගේ පිහිටයයි නොකියන්නේය. උපාසක විසින් කායිකය හා වාචසිකය රක්ෂා කරණ ලද්දේ ද, සමගිභාවය කැමති වේද, සමගිතාවයෙ නිරතවූයේ වේද, ඊෂ්‍යානොකරණ කෙනෙක් වේද, ශාසනික කටයුතු වෙනුවෙන් වංචාකාරී ක්‍රියාවන්ගෙන් වෙන්වූයේ වේද, ත්‍රිවිධරත්නය දිවිහිමියෙන් සරණ ගිය කෙනෙක් විය යුත්තේ වේද,

''මහරජතුමනි, මෙකී ගුණාංගයෝ තොප කෙරෙහි විද්‍යාමානව පවතී. තොපට ඒ ඒ උපාසක ගුණාංගය තිබේ. එම නිසා තොප සම්බුඬ ශාසනය ආරක්ෂාව පිණිස සුදුසුය. තෙපි මෙම බුඬ ශාසනය පිරිහීමක් දැක එය එයින් මුදවා අභිවෘද්ධියක් කැමැත්තෝය. යහපත, තොපට අවකාශ කරමි, තොප මාගෙන් කැමති ආකාරයටම ප්‍රශ්න විචාරවායි වදාළ සේක.

''ස්වාමීනි, නාගසේනයන් වහන්ස, මේ අන්‍ය ලබ්ධිමත් තීර්ථකයෝ මෙසේ කියන්නාහුය :- බුදුරජාණන් වහන්සේ ලෝකයා කරන පූජාවන් ඉවසනසේක් වී නම්, කේලශපරිනිර්වාණයෙන් පිරිණිවන් නොපෑසේක. බුදුරජාණන් වහන්සේ ලෝකයා හා සම්බන්ධය. භවයට ඇතුල් වූ සේක. ලෝකයා කෙරෙහි ලෝකයා හා සාධාරණ වූ සේක. එමනිසා ඒ බුදුරජාණන් වහන්සේට කරන පූජා සත්කාර වඳ වන්නේය, හිස් වන්නේය, නිෂ්ඵල වන්නේය. එමනිසා කේලශයන් කෙරෙන් මිදී පිරිණිවන් පා වදාළ සේක් නම්, ලෝකයා සමග සම්බන්ධ නොවූසේක. සියලුම භවයන් විසින් හරණ ලදවූ සේක. බුදුරජාණන් වහන්සේ එම පූජාවන් මදකුත් නොඉවසන සේක. නොඉවසන්නා වූ අප්‍රාණි බුදුරජාණන් වහන්සේට කරණ ලද පූජා සත්කාරය හිස්වන්නේය. වඳවන්නේය. අඵලවන්නේය. නිෂ්ඵලවන්නේය'යි කියත්.

''ස්වාමීනි, නාගසේනයන් වහන්ස. මේ දෙකෙළවරක් ඇති උභතෝකොටික ප්‍රශ්නයකි. අසම්ප්‍රාප්ත වූ රහත්ඵල සිත් ඇත්තවුන්ට මෙම ප්‍රශ්නය විෂය නොවන්නේය. මෙම දෘෂ්ටි ජාලය බිඳ වදාළ මැනව. පරවාදයන්ට නිග්‍රහ කරණු පිණිස මතු අනාගතයෙහි වසන සර්වඥපුත්‍රයන්ට ප්‍රඥා ඇසක් දෙවා වදාළ මැනව.''

එවිට නාගසේන තෙරුන් වහන්සේ වදාරණ සේක් :- මහරජතුමනි, අප භාග්‍යවතුන් වහන්සේ අනුපාද නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පා වදාළ සේක. ඒ පිරිණිවියා වූ භාග්‍යවතුන් වහන්සේ පූජාසත්කාර නොඉවස සේක. ප්‍රථම බෝධි මූලයෙහිදීම තථාගතයන් වහන්සේගේ භවතෘෂ්ණාකොට ගන්නා ආසාවන් අවසන් කරන ලදී. දැන් අනුපාදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිණිවන් පා වදාළ සර්වඥයන් වහන්සේගෙ පිළිගැනීමක් නැති බව කියනුම කවරේද?

''මහරජාණනි, මෙම කාරණය සාරි නම් බ්‍රාහ්මණ දෙවීන්ගේ පුත්‍ර වූ සද්ධර්ම සේනාධිපති වූ අග්‍රශ්‍රාවක වූ මහාථෙර ස්වාමීන් වහන්සේ විසින් වදාරණ ලද්දේය. සදිව්‍ය මනුෂ්‍යයන් විසින් අසම සමවූ සර්වඥයන් වහන්සේලා පුදනු ලබන්නේය. ඒ සර්වඥයන් වහන්සේලා වෙත කරන පූජා සත්කාරය සතුටක් කොට නොඉවසති. අනන්ත වූ බුදුරජාණන් වහන්සේලාගෙ මේ ධර්මතාවයකැ'යි වදාළ සේක.

ඒ අසා මිළිඳු රජතුමා කියන්නේ ''ස්වාමීනි, නාගසේනයන් වහන්ස, පුතා පියාගෙ ගුණ කියන්නේය. පියා පුතාගේ ගුණ කියන්නේය. පරවාදයන්ගෙ නිග්‍රහයට මෙය කාරණයක් නොවන්නේය. සැරියුත් මහතෙරුන් වහන්සේ කී මෙම කාරණය බුදුරජාණන් වහන්සේ කෙරෙහි ප්‍රීතියෙන් කළ ප්‍රසාදය ප්‍රකාශ කිරීම නම් වන්නේය. ඔබ වහන්සෙ මට එම උභතොකෝටික ප්‍රශ්නයෙහිලා ස්වකීය වූ ශාසනවාදයාගෙ ප්‍රතිෂ්ඨාව පිණිසත්

දෘෂ්ටිජාලයාගෙ දඟ හැරීම පිණිසත් වෙනත් කාරණයක් මනාකොට වදාළ මැනවැ'යි කීහ. එවිට නාගසේන ස්ථවිරයන් වහන්සේ වදාරණ සේක් :- මහරජතුමනි, අප භාග්‍යවතුන් වහන්සේ පිරිණිවන් පා වදාළ සේක. භාග්‍යවතුන් වහන්සේ ලෝකයාගෙ පූජා සත්කාරයන් නොඉවසන සේක. නොඉවසන්නාවූ එම තථාගතයන් වහන්සේගෙ ශාරීරික, පරිභෝගික වූ ධාතුරත්නය දිව්‍ය මනුෂ්‍යයො ප්‍රතිෂ්ඨාකොට ගෙන (උපකාරකරගෙන) තථාගතයන් වහන්සේගෙ බුඩඥාණ නමැති රත්නය අරමුණුකොට ගෙණ මනා කොට ප්‍රතිපත්තිය සෙවනය කරන්නාහු ත්‍රිවිධ වූ සම්පත්තීන්ම ලබන්නාහුය.

''මහරජාණෙනි, යම් සේ මහත් වූ මහ ගිනිකඳක් දිළිසෙමින් ඇවිල නිවී ගියේ නම්, ඒ මහා ගිනිජාලාව වියළීගිය තණ පරඬැල්, දර සහ වෙනත් ගිනි ඇවිලෙන ද්‍රව්‍ය ආසාවෙන් බලාපොරොත්තුව ඉවසන්නේද'යි විචාල සේක. ''ස්වාමීනි, එම මහා අග්නිස්කන්ධය ඇවිළෙමින් සිට තෘණ, කාෂ්ඨ, උපාදානයන් කැමැත්තකින්, ආසාවකින්, එකී ද්‍රව්‍ය බලාපොරොත්තු නොවන්නේය. කිමෙක්ද? එසේ කල නිවී ගියාවූ උපශාන්ත වූ අචෙතන එම ගිනිකඳ නිරුද්ධව නිවී උපශාන්තවූ කල්හි ලෝකයෙහි ගින්දර නැතිවේද?'යි විචාල සේක. නැත ස්වාමීන් වහන්ස, වියළි තණ පරඬලා නැවත ගිණි ඉපිදවීමට හේතු කාරණා වන්නේය. ගැණීම වන්නේය. ගිනි බලාපොරොත්තුවන යම්කිසි මනුෂ්‍යයෙක් වෙත්ද, එම මනුෂ්‍යයො තමන්ගේ ශක්තිබල වීර්‍යයෙන්ම තමා තුළ වූ පුරුෂකාරයෙන්ද ගිනි උපදවාගෙණ එම ගින්නෙන් තම තමන්ට අවශ්‍ය කටයුතු කර්මාන්තාදිය කරන්නාහුය'යි කීහ.

''මහරජාණෙනි, එසේ නම් නොඉවසන්නා වූ තථාගතයන් වහන්සේට කරණ ලද අධිකාර නම් වූ පූජා සත්කාරය වඳවන්නේය, හිස් වන්නේය, නිෂ්ඵල වන්නේයයි කියන්නා වූ මිථ්‍යා දෘෂ්ටීන්ගේ වචනය බොරු වන්නේය. තුච්ඡ වන්නේය. හිස් වන්නේය. මහරජාණෙනි, යම් සේ මහත් වූ අග්නිස්කන්ධය දිළිසෙමින්

ඇවිලෙන්නේද, එපරිද්දෙන්ම අප භාග්‍යවතුන් වහන්සෙ දස සහ ශ්‍රී ලෝක ධාතුයෙහි අනන්ත වූ බුඩශ්‍රීන් දිළිසුණු සේක.''

''මහරජතුමනි, යම් සේ අග්නිස්කන්ධය දිළිසී ගොස් නිවී ගියේද, එපරිද්දෙන්ම බුදුරජාණන් වහන්සේ දස සහශ්‍රී ලෝක ධාතුයෙහි බුඩශ්‍රීයෙන් දිළිසෙමින් අනුපාදිසෙස වූ නිර්වාණ ධාතුවෙන් පිරිණිවන් පා වදාළ සේක. මහරජාණෙනි, යම් සෙ නිවී ගියාවූ මහා ගිණිජාලාව තණ කාෂ්ඨ නොඉවසාද එපරිද්දෙන් ලෝකයා හට හිත වැඩ කැමැත්තා වූ තථාගතයන් වහන්සේ තෘෂ්ණාව ප්‍රහීන කළ සේක. උපශාන්ත වූවාය. මහරජාණෙනි, යම් සේ ගිණි කැමති මනුෂ්‍යයො නිවී ගියාවූ ගිණිජාලාවෙහි උපාදාන නම් ගැණීමක් නැති කල්හි තමන්ගේ ශක්ති බල වීර්‍යයෙන් තමා තුළවූ පුරුෂ බලයෙන් ගිණිගානා කාෂ්ඨ උපයොගි කොට උපදවා එම ගින්නෙන් කළයුතු වූ කර්මාන්තයන් කරන්නාහුය.

එපරිද්දෙන්ම දිව්‍ය මනුෂ්‍යයොද පිරිණිවියාවූ කිසිවක් නොඉවසන්නාවූ තථාගතයන් වහන්සේගෙ ධාතුරත්නය ප්‍රතිෂ්ඨාකොට ගෙණ බුදුරජාණන් වහන්සෙගෙ ඥාණරත්නය අරමුණුකොට ගෙන මනාකොටම ප්‍රතිපත්තිය සේවනය කරන්නාහුය. මහරජාණෙනි, මෙම කාරණයෙනුත් පිරිණිවියාවූ, කිසිවක් නොඉවසන්නාවූ බුදුරජාණන් වහන්සේට කරණ ලද අධිකාරයතෙම අවඳ වන්නේය. අනන්ත පලදෙන බැවින් සඵල වන්නේය. මහරජාණෙනි, තවත් කාරණයක් ඇත. යම් කාරණයකින්, පිරිණිවියාවූ කිසිවක් නොඉවසන්නාවූ බුදුරජාණන් වහන්සේ කරණ ලද සත්කාරය නිෂ්ඵලවේද, සඵලවේද, එම කාරණයත් ඇසුව මැනව.

''මහරජාණෙනි, යම් සේ දරුණු වූ කුණාටුව නොයෙක් ගස් වැල් පෙරළා වැතිර ගොස් නවතී නම් ඒ නැවතුනාවූ වාතය නොහොත් සුළඟ නැවත හටගැනීමක් සතුටකින් ඉවසාද?''යි විචාල සේක. ''ස්වාමීනි, නැවතුනා වූ කුණාටුව නැවත හටගැනීමක් පිණිස

සිහි කල්පනාවක් හෝ පාලනය කරවන සිතක් හෝ නැත්තේය. එයට හේතුව කුමක්ද? යත් :- එම වායො ධාතුවට සිතක් නැත්තේය'යි වදාළ සේක. මහරජතුමනි, වැළකුණාවූ එම වායුවෙ නැවත වාතයයි යන සංඥාව නැතිවේද''යි විචාළ සේක. ''නැත ස්වාමීනි, තල්වැට විදුපානාදීහු එම වාතයාගෙ උත්පත්තියට ප්‍රත්‍ය වන්නාහුය. උෂ්ණයෙන් තැවුනාවූ පරිළාහයෙන් දැවීම වූවාවූ යම්කිසි මනුෂ්‍යයෙක් ඇද්ද ඒ මනුෂ්‍යයො විජිනි පතකින් හෝ සතරැස් පවන් පතකින් හෝ තමන් ශක්තිබල වීර්‍යයෙන් ප්‍රත්‍යාත්ම පුරුෂකාරයෙන් වාතය උපදවාගෙන එම වාතයෙන් රෂ්මිය නිවන්නාහුය. දැවීම සමනය කරන්නාහුය. ''මහරජාණෙනි, එම කාරණයෙන් නොඉවසන්නාවූ තථාගතයන් වහන්සේට කරණ ලද සත්කාරය වඳවන්නේය, නිෂ්ඵලවන්නේය'යි කියන්නාවූ මිත්‍යා දෘෂ්ටීන්ගේ වචනය බොරුවන්නේය.

''මහරජාණෙනි, යම් සේ මහත් වූ වාතය හමා පැතිරගියේවේද, එපරිද්දෙන්ම අප භාග්‍යවතුන් වහන්සේ දශසහශ්‍රී ලෝක ධාතුවෙහි ශීතල මධුරතර ශාන්ත සුඛුම මෛත්‍රීවාතය පතුරුවා වදාළ සේක. මහරජාණෙනි, යම් සේ මහත් වූ වාතය පැතිර ගොස් වැළකුණේද, එයාකාරයටම අප බුදුරජාණන් වහන්සේ ශීතල මධුරතර ශාන්ත ප්‍රණීත කරුණා මෛත්‍රී වාතයෙන් තුන් ලෝ පතුරුවා හමා අනුපාදිශෙෂ වූ නිර්‍වාණ ධාතුවෙන් පිරිණිවුණු සේක. ''මහරජාණෙනි, යම් සේ නැවතුනාවූ කුණාටුව නැවත ඇතිවීමත් බලාපොරොත්තු නොවේද, එයාකාරයටම බුදුරජාණන් වහන්සේගෙ ඉවසීම නැවතුනාය ව්‍යුපශාන්තවූවාය. යම් සේ මනුෂ්‍යයො පරිලාහ ප්‍රපීඩිත වූද, එපරිද්දෙන්ම දිව්‍ය මනුෂ්‍යයො රාග-ද්වේෂ-මොහ ත්‍රිවිධාග්නි සන්තාප ප්‍රපීඩිත වුවාහුය. යම් සේ තාලවණ්ටය හා විධුපන නම් සිවුරැස් පවන්පත් ආදිය වාතයාගෙ ඉපදීම පිණිස උපකාරවෙත්ද, එපරිද්දෙන්ම බුදුරජාණන් වහන්සේගෙ ශාරීරික, පරිභොගික ධාතු රත්නයද සර්‍වඥතා ඥාණරත්නයද ත්‍රිවිධ

සම්පත්තීන්ගෙ ප්‍රතිලාභය පිණිස ප්‍රත්‍ය වන්නේය. යම් සේ උෂ්ණාශිතප්ත ග්‍රීෂ්ම ප්‍රපීඩිත වූ මනුෂ්‍යයො තාලවණ්ටයෙන් (මයිලහම) විදුලි පංකාවකින් හෝ වෙනත් ක්‍රමයකින් වාතය උපදවා රශ්මිය නිවා ගනිත්ද, දැවීම වලක්වා ගනිත්ද එපරිද්දෙන්ම දිව්‍ය මනුෂ්‍යයො පිරිණිවියාවූ කිසිවක් බලාපොරොත්තු නොවන්නා වූ බුදුරජාණන් වහන්සේගේ ධාතුරත්නයද, ඥාණ රත්නයද යථා ශක්තීන් පුදා කුසල් උළුදවාගෙණ එම කුසල් බලයෙන් රාග-ද්වේෂ-මොහ ත්‍රිවිධාග්නිසන්තාප උෂ්ණය නිර්වාපණය කෙරෙති පරිළාහය ව්‍යුපගමනය කෙරෙති. මෙම කාරණයෙනුත් පිරිණිවී වදාළවූ කිසිවක් නොඉවසන්නාවූ බුදුරජාණන් වහන්සේට කළ සත්කාරය ඉතිරි වන්නේය සඵල වන්නේය.

''මහරජාණෙනි, තවත් කාරණයක් ඇසුවමැනව. යම් සේ පුරුෂයෙක් බෙරයකට ගසා ශබ්දයක් උපදවා ගන්නේය. එසේ බෙරයකට ගසා උපදවා ගන්නාවූ ශබ්දය අතුරුදහන් වන්නේය. මහරජාණෙනි, එම බෙර ශබ්දය නැවත ශබ්ද කිරීමට බලා සිටීද?''යි විචාලසේක. ''නැත ස්වාමීනි, එම ශබ්දය නැතිවී ගියේය. එම ශබ්දය ඉපදීම පිණිස කල්පනාවක් හෝ මනසක් නැත්තේය. එක්වරක් උපන්නාවූ බෙර ශබ්දය අතුරුදහන් වූ කල්හි එම බෙර ශබ්දය හාත්පසින්ම නැතිවෙයි. ස්වාමීනි, ශබ්දය ඉපිදවීම පිණිස බෙරය ප්‍රත්‍ය වන්නාහ. නැවත එම පුරුෂයා අවශ්‍යතාවයක් වූ කල්හි ආත්මජ වූ වීර්‍යයෙන් බෙරය ගසා ශබ්දය උපදවා ගන්නේය. ''මහරජාණෙනි, එපරිද්දෙන්ම අප භාග්‍යවත් වූ සර්වඥයන් වහන්සේ තමන්ගේ සීල, සමාධි, ප්‍රඥා, විමුක්ති, විමුක්තිඥාන දර්ශනයෙන් වැඩුනාවූ ධාතුරත්නයද, ධර්ම විනයද, අනුශාසනාවද තමන් වැනි ශාස්තෘවත් කොට තබා වදාරමින් තෙමේ අනුපාදිසෙස වූ නිර්වාණ ධාතුවෙන් පිරිණිවන් පා වදාළ සේක. පිරිණිවියාවූ භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි සම්පත්ති ලාභය සිදී ගියේය. සංසාරභවදුක්ඛයෙන් පීඩිතව වෙහෙසුනා වූ සත්වයෝ

ධාතුරත්නයද, ධර්මවිනයද, අනුශාසනාවද ප්‍රත්‍ය කොට ගෙන යථාශක්තීන් පුදා ත්‍රිවිධ වූ සම්පත් කැමති අය ඒ සම්පත් ලබන්නාහුය. මහරජාණෙනි, මෙම කාරණයෙනුත් පිරිනිවියාවූ කිසිවක් නොඉවසන්නා වූ බුදුරජාණන් වහන්සේට පූජා සත්කාර වශයෙන් කරණ ලද අධිකාර කෘත්‍යතෙම අවඳවන්නේය. සඵල වන්නේය. ''මහරජාණෙනි, අපගේ භාග්‍යවතුන් වහන්සේ විසින් මේ අනාගත කාලය දක්නා ලද්දේය, කථනය කරන ලද්දේය, වදාරණ ලද්දේය.

අප බුදුරජාණන් වහන්සේ මෙසේ වදාරා තිබේ. ''ආනන්දයෙනි, තොපට අතීත ශාස්තෘක වූ බුඬ වචනයක් ඇත. අපගෙ ශාස්තෘන් වහන්සෙ මෙකලට නැත'යි කියා මෙසේ සිතක් ඇතිවන්නේද, ආනන්දයෙනි, මේ කාරණය මෙසේ නොදතයුත්තේය. තොපට මා විසින් යම් ධර්මයක්, විනයක් දේශනා කරන ලදද, පනවන ලද්දේද එම ධර්ම විනය මාගේ පිරිණිවීමෙන් තොපට අනුශාසනා කරණ ලොවුතුරා ශාස්තෘ කෙනෙක''යි තියා වදාළ සේක. ''මහරජාණෙනි, මෙම කාරණයෙන් පිරිනිවියාවූ කිසිවක් නොඉවසන්නා වූ තථාගතයන් වහන්සේට කරණ ලද්දාවූ පූජා සත්කාරය වඳ වන්නේය. නිෂ්ඵල වන්නේයයි කියන්නා වූ තීර්ථකයන්ගෙ එම වචනය මිථ්‍යා වන්නේය. අභූත වන්නේය. මුසාවාද වන්නේය. විරුද්ධ වන්නේය. විපරිත වන්නේය. දුක් වන්නේය. දුක් විපාක වන්නේය. අපාගත වන්නේය.''

''මහරජාණෙනි, තවත් ඉතිරි කාරණයක් ඇත. යම් හේතුවකින් පිරිණිවියා වූ කිසිවක් නොඉවසන්නාවූ බුදුරජාණන් වහන්සේට කරණ ලද අධිකාරය ප්‍රයෝජන වේද, සඵල වේද, එම කාරණයත් ඇසුව මැනව, මහරජාණෙනි, මේ මහා පෘථිවිය ''සියලුම භීජජාතීහු මා කෙරෙහි හටගනිත්වායි කියා ඉවසාද?''යි ඇසූ සේක. ''නැත ස්වාමීනි'යි කීහ. ''එසේ නම් මහරජාණෙනි, කුමක් පිණිස ඒ භීජජාතීහු නොඉවසන්නාවූ මහා පෘථිවියෙහි හටගෙණ දැඩි වූ

මුල්වලින් සහ ඔබිනොබ විසිර පවත්නා කඳන් අතුරිකිළි ශාඛාවන්ගෙන් හාත්පසින් විස්තීර්ණව පුෂ්පඵලදරයො වෙත්ද?''යි විචාළ සේක.

''ස්වාමීනි, නාගසේනයන් වහන්ස මේ මහා පෘථිවිය නොඉවසන්නී නමුත් නොයෙක් ආකාරයේ බීජවර්ගයන්ට පිහිටාධාර වන්නේය. එම බීජයන්ගේ වැඩීම පිණිස උදව් උපකාර දෙන්නීය. එම බීජජාතීහු පෘථිවිය පිහිටාධාර කරගෙණ ඒ දෙන ප්‍රත්‍යකරණ කොටගෙණ හටගෙන දැඩි වූ මුල ජටා ප්‍රතිෂ්ඨිත වූවාහු කඳන් අරටු ශාඛාවෙන් හාත්පසින් විස්තීර්ණ වූවාහු පුෂ්ඵ පලධරයො වෙති''යි කීහ. මහරජාණෙනි, එසේ නම් ඉතින් ''නොඉවසන්නාවූ, තථාගතයන් වහන්සේට කරන ලද අධිකාරය වඳවන්නේය, අඵලවන්නේය'යි කියා විරුද්ධ වූ ඒ මිත්‍යාවන් කියත් නම්, තීර්ථකයො තමන්ගෙ ස්වකීය වූ මිත්‍යාවාදයෙහි පැරදුන අය වෙති. නස්නා ලද්දාහු වෙති. යම් සේ මේ මහා පෘථිවියද එපරිද්දෙන්ම තථාගත වූ බුදුරජාණන් වහන්සේ දතයුත්තේය. මහරජාණෙනි, යම් සේ මහා පෘථිවිය කිසිවක් නොඉවසාද, එපරිද්දෙන්ම බුදුරජාණන් වහන්සේද කිසිවක් නොඉවසන සේක. යම් සේ ඒ බීජජාතීහු පෘථිවිය නිසා හටගෙන දළුළන මූල ජටා ප්‍රතිෂ්ඨිතවූවාහු ඛන්ද සාර ශාඛාවන් පැතුරුණාහු පුෂ්පඵලධරයො වෙත්ද, එපරිද්දෙන් දෙවි මිනිසුන් පිරිණිවියා වූ කිසිවක් නොඉවසන්නාම වූ බුදුරජාණන් වහන්සේගෙ ධාතුරත්නය හා ඥානරත්නය කරණකොට ගෙණ පොළොව යටට ගිලා බැසී දැඩි වූ මුල් නමැති වෘක්ෂ ස්කන්ධයන් හා සද්ධර්ම නමැති අරටු ඇති සතර සංවර ශීල නමැති අතුරිකිළි පතලාහුය. පඤ්චවිධ විමුක්ති නමැති පඤ්ච වර්ණ පුෂ්පයෙන් හා ශ්‍රාමාණ්‍යමාර්ගඵල නමැති අමෘත ඵලධරයො වෙති.

''මහරජාණෙනි, මෙම කාරණයෙනුත් පිරිණිවී වදාළා වූ කිසිවක් නොඉවසන්නාමවූ බුදුරජාණන් වහන්සේට කරණ ලද අධිකාරිය තෙම ස්ථිරවන්නේය. සපල වන්නේය. තවද

''මහරජාණෙනි, තවත් කාරණයක් ඇත. යම් හේතුවකින් පිරිණිවියා වූ කිසිවක් නොඉවසන්නාම වූ තථාගතයන් වහන්සේට කරණ ලද අධික ක්‍රියා අවඳවේද, සඵලවේද එම කාරණයත් ඇසුව මැනව. මේ මනුෂ්‍යයො අටඅනූවක් පමණ රෝගයො අපගෙ මෙම ශරීරයෙහි උපදිත්ව'යි කියා කැමතිව ඉවසන්නාහු''ද? යි විචාළසේක. ''නැත ස්වාමීනි,යි කීහ. මහරජාණෙනි, ඒ අටානූවක් පමණ රෝගයෝ කුමක් පිණිස නොඉවසන්නාවූ එම මනුෂ්‍යයන්ගෙ ශරීරයෙහි පතිතව උපදින්නාහුද?''යි අසා වදාළ සේක. ස්වාමීනි, පූර්ව ජාතිවලදී කළ දුශ්චරිතයාගේ කර්ම විපාකයන්ගෙ ශේෂ අකුශල බලයන්ගේ විපාකයෙන් රෝගයො උපදිති''යි කීහ. මහරජාණෙනි, එසේ නම් පූර්ව ජාතිවලදී කරණ ලද අකුශල කර්මය මෙම ආත්මයෙහිදී විඳීම වේනම්, එම කාරණයෙනුත් පූර්ව ජාතියෙහි කරණ ලද්දාවූත් මේ ජාතියෙහි කරණ ලද්දාවූත් කුශලාකුශල කර්මය විපාක දෙන්නේය. සඵලවන්නේය.

''මහරජතුමනි, නන්දක නම් යක්ෂයෙක් එක්දිනක් සැරියුත් මහතෙරුන් වහන්සේට පසුපසින් පැමිණ අත මිටමොලවා තදින් පහරක් ගසා එම පාපකර්මයෙන් පොළොව පලාගෙන අවීචි මහ නිරයට වැටුණේය''යයි තොප විසින් අසා තිබේද?'යි විචාළ සේක. ''එසේය ස්වාමීනි, 'අසා තිබේ' යයිද ඒ බව ලෝකයෙහිත් ප්‍රකටය''යි කීහ. ''කිමෙක්ද මහරජතුමනි, සැරියුත් මහතෙරුන් වහන්සෙ නන්දන යක්ෂයාගෙ අපාගතවීම කැමතිව ඉවසූසේක්ද?, ''ස්වාමිනි, නාගසේනයන් වහන්ස, දෙවියන් සහිත ලෝකය නැතිව අභාවයට යන්නේ වී නමුත් හිරු-සඳු-පෘථිවියෙහි වැටී ගියත් උන්වහන්සේ අනුන්ට වන දුක් පීඩාවක් වෙනුවෙන් සතුටු නොවන්නාහ, ඒ කෙසේද? යත් :- යම් හේතුවකින් සැරියුත් මහතෙරුන් වහන්සේ කෝපවන සේක්නම්, සිත දූෂණය වන සේ නම්, ඒ කිපෙන කාරණය මහතෙරුන් වහන්සේ විසින් නැති කරණ ලද්දේය. රහත් මාර්ග ශාස්ත්‍රයෙන් සිඳහරින ලද්දේය. ස්වාමීනි, එම හේතුන් නසා හැරිය

බැවින් සැරියුත් මහරහතන් වහන්සේ තමන් වහන්සේගෙ ජීවිතය නසනවුන් කෙරෙහිත් කෝප නොකරණ සේක''යි කීහ.

එසේ නම් මහරජතුමනි, සැරියුත් මහතෙරුන් වහන්සේ නන්දක නම් යක්‍ෂයාගෙ පෘථිවියෙහි ගිළීයාම නොඉවසුවෙක් නම්, කුමක් පිණිස නන්දන නම් යක්‍ෂයා පෘථිවියට ප්‍රවිෂ්ඨ වූයේද?''යි විචාලෙසේක. ස්වාමීනි ඔහු කළ අකුශල කර්‍මයාගේ බලවත් බැවින''යි කීහ. ''මහරජාණෙනි, එසේ නම් අකුශල කර්‍මයාගේ බලයෙන් නන්දක නම් යක්‍ෂ තෙම පෘථිවියෙහි ගැලී ප්‍රවිෂ්ට වූයේ නම්, සිතින් නොඉවසන්නාහටත් කරණ ලද අපරාධය අපායෙහිම හෙළන බැවින් අවඳ වන්නේය. නොයෙක් දුක්විපාක විඳවන බැවින් සඵලවන්නේය''. මහරජාණෙනි, එම නිසා කුශලකර්‍මයාගෙ බලවත් බැවිනුත් නොඉවසන්නාහටත් කරණ ලද අධික ක්‍රියා දෙව්ලොව උපදවන බැවින් අවඳ වන්නේය. නොයෙක් සැප සම්පත් විඳවන බැවින් සඵලවන්නේය. මෙම හේතුවෙනුත් පිරිණිවී වදාළ කිසිවක් නොඉවසන්නා වූ බුදුරජාණන් වහන්සේට කරණ ලද අධික ක්‍රියා අවඳ වන්නේය. සඵල වන්නේය.'' මහරජාණෙනි, දැන් මේ බුද්ධෝත්පාදයෙහි යම් මනුෂ්‍යයෙක් පෘථිවියට ප්‍රවිෂ්ඨ වූවාහුද, ඒ පොළොව පලාගෙණ අපායට ගියාහු කොපමණද? ඒ පෘථිවි ප්‍රවිෂ්ඨ වූ කාරණෙයෙහි තොපගෙ ඇසීමෙක් ඇද්ද?''යි විචාළ සේක.

''එසේය ස්වාමීනි, මා විසින් අසන ලදී,යි කීහ. ''මහරජතුමනි, එසේ නම් මට එය කියවායි කී සේක. ''ස්වාමීන් වහන්ස, චිඤ්චිමාණවිකාව, සුප්‍රබුද්ධ ශාක්‍ය රජතුමා දෙවදත්ත තෙරණුවොය, නන්දක නම් යක්‍ෂයාය, නන්දක නම් මානවකයාය, යන මේ පස් දෙනා පෘථිවිය පලාගෙන අපාගත වූවාය'යි කියා මා විසින් මෙම කාරණය අසන ලදී. ''රජතුමනි, ඒ පස්දෙනාට එසේ වීමට කාහට කරපු අපරාධයක්ද? හේතුවූයේ, ''ස්වාමීනි, බුදුරජාණන් වහන්සේ කෙරෙහිත් ශ්‍රාවකයන් වහන්සේලා කෙරෙහිත් වැරදි අපරාධ කළ නිසායයි, කීහ. ''කිමෙක්ද? මහරජතුමනි, බුදුරජාණන් වහන්සේ හෝ

ශ්‍රාවකයන් වහන්සේලා හෝ මේ පස්දෙනා අපාගත වීම ඉවසුවාද?'' නැත ස්වාමීන් වහන්ස'යි කීහ. මහරජාණෙනි එසේ නම් පිරිණිවන් පා වදාළා වූ කිසිවක් නොඉවසන්නාවූ තථාගත බුදුරජාණන් වහන්සේට සියලු ලෝ වාසීන් විසින් කරණ ලද්දාවූ පූජා සත්කාරය වඳවන්නේය. හිස් වන්නේය. අඵල වන්නේය''යි කියා මෙසේ දෘෂ්ටිවාදයෙන් බුදුරජාණන් වහන්සේ ලෝකයාගෙ පූජා සත්කාර ඉවසන සේක් නම් නිවන් නොදැක සත්ව ලෝකයෙහිම හිඳිනා සේක.

ඔහට කළ පූජායෙහිත් ඇතිඵලය මොකක්ද? සත්ව ලෝකයා කෙරෙන් මිදී නිවන් දක්නා ලද්දේ නම් සත්ව ලෝකයෙහි නැති බැවින් නොඉවසන බුදුරජාණන් වහන්සේට කරණ ලද පූජා සත්කාරයනුත් කමක් නැත''යි කියා දෙකෙළවරක් අල්ලා මෙම උභතෝකෝටික ප්‍රශ්නය විචාල මිළිඳු රජතුමාව අඹ කෑමට ආශාවෙන් සිටි පුද්ගලයෙකුට විශාල උස් ගසක අමෘතඵල භරිත මහ අඹ වෘක්ෂය සොලවාපු කලක් මෙන් තමන් වහන්සේගෙ ශ්‍රැතාන්තබුද්ධීන් අනෙක ප්‍රකාර උපමා ගෙණහැර දක්වා රජතුමාගෙ දෘෂ්ටිය ප්‍රලයකොට විධාවංසනය කර වදාළ සේක.

එකල මිළිඳු රජතුමා සතුටින් පිණාගොස් දොහොත් මුදුනෙහි තබාගෙන සාධු ! සාධු ! සාධු ! ස්වාමීනි, නාගසේනයන් වහන්ස ඔබවහන්සේ විසින් මෙම ගාම්භීර වූ ප්‍රශ්නය යහපත් කොට අවබෝධ කරවන ලද්දේය. ප්‍රකාශ කර වදාරණ ලද්දේය. රක්ෂා කටයුතු වූ රහසක් ප්‍රකාශ කරන ලද්දේය. ප්‍රකාශ වදාරණ ලද්දේය. දෘෂ්ටි ගැටය බිඳහරණ ලද්දේය. දෘෂ්ටි ග්‍රහනය නොගැන්ම කරණ ලද්දේය. එමනිසා උතුම් සමූහයකට ස්වාමි වූ ඔබවහන්සේ කරා පැමිණ පරවාදයො නෂ්ටවූහ. මිථ්‍යාදෘෂ්ටීහු භග්න වූහ. අන්‍ය ලබ්ධිගත් ලාමක වූ තීර්ථකයො හිරු දුට කළාමැදිරියන් සේ නිෂ්ප්‍රභ වූවාහුය''යි කියා ප්‍රශංසා කළහ.

නිමි.

රත්මලාන ගොළුමඩම කල්දෙමුල්ලේ දෙමහල් නිවසක් තුළ සිය බිරිඳ සහ දරුවන් දෙදෙනා ගෙල හිරකර ඝාතනය කර පුළුස්සා දැමීම.

මියගිය සඳමාලි ප්‍රනාන්දු මහත්මිය ඇගේ වැඩිමහල් පුත්‍රයා සමග



සිය බිරිඳ සහ දරු දෙදෙනා ඝාතනය කිරීමේ සිද්ධියේ සැකකරු වන විජයමුණි මධුරංග ද සිල්වා නමැත්තා ඊයේ (01) ගල්කිස්ස අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසුව යළිත් රිමාන්ඩ් බන්ධනාගාරය වෙත ගෙන යනු ලැබූ අවස්ථාව

කල්දෙමුල්ලෙ ගුරුවරිය හා දරු දෙදෙනා ඝාතන සිද්ධිය

''ඝාතන දිනට පසුදා පාන්දර පහමාරට විතර මධුර නොසන්සුන් ලෙස කල්පනා කරමින් අම්මා වටේ සක්මන් කළා''

සැකකරුගේ මස්සිනා සාක්කි දෙමින් කියයි

(වැල්ලවත්ත එම්.එස්. පෙරේරා සහ දසුන් රාජපක්ෂ)

''හැමදාම මධුර ගුප්ත නිහඬ ජීවිතයක් ගත කළේ. මගේ බිරියගේ සහෝදරිය සහ දරුවන් දෙදෙනා ඝාතනය කළේ ඔහු බවට සැක සිතුනේ ඝාතනය වූ දිනට පසුදින පාන්දර පහ හමාරට විතර ඔහු නොසන්සුන්කාරී ලෙස කල්පනා කරමින් අම්මා වටා සක්මන් කළ නිසා'' යැයි රත්මලාන, ගොළුමඩම, කල්දෙමුල්ලේ දෙමහල් නිවෙසක් තුළ බිරිය සහ දරුවන් දෙදෙනා ගෙල සිරකර ඝාතනය කර පුළුස්සා දැමූ සැකකරුගේ මස්සිනා වන රජයේ ඖෂධවේදී චන්දන කුමාර පතිරණ මහතා ගල්කිස්ස ප්‍රධාන මහේස්ත්‍රාත් නිරෝෂා ප්‍රනාන්දු මහත්මිය හමුවේ සාක්ෂි දෙමින් පෙරේදා (23) ප්‍රකාශ කළේය.

මෙම ඝාතන සිද්ධියට අදාලව සිටි කෙරෙන මරණ පරීක්ෂණ සාක්ෂි විමසීම සඳහා සාක්ෂිකරුවකු ලෙස නම්කර තිබීම හේතුවෙන් චන්දන කුමාර පතිරණ මහතා ගල්කිස්ස පොලිස් කොට්ඨාස භාර සහකාර පොලිස් අධිකාරී ජේ.එම්.පී. ජයලත් මහතාගේ මෙහෙයවීම යටතේ පෙරේදා (23) අධිකරණය හමුවේ එලෙස සාක්ෂි ලබා දුන්නේය.

මීට ඉහතදී සැකකරුගේ මව ඝාතනයට ලක්වූ කාන්තාවගේ සොහොයුරා 'සැකකරුගේ නිවසේ සේවය කළ මෙහෙකාරිය සහ

සැකකරු සමග අනියම් ප්‍රේම සම්බන්ධයක් පැවැත්වූ බව කියන තරුණිය අධිකරණය හමුවේ සාක්ෂි ලබාදී තිබිණි.

අවසන් සාක්ෂිකරු ලෙස නම් කර සිටි ඝාතනයට ලක්වූ කාන්තාවගේ නැගණියගේ සැමියා වන, මහරගම පිළිකා රෝහලේ ඖෂධවේදියෙකු ලෙස කටයුතු කරන ගණේමුල්ලේ පදිංචි චන්දන කුමාර පතිරණ (32) මහතා පෙරේදා (23) අධිකරණය වෙත පැමිණ සිටියේය. ගල්කිස්ස පොලිස් කොට්ඨාසය භාර සහකාර පොලිස් අධිකාරී ජේ.එම්.පී. ජයලත් මහතාගේ මෙහෙයවීම යටතේ සාක්ෂි දුන් චන්දන කුමාර පතිරණ මහතා මෙසේ කීය.

'මා සාක්ෂි කූඩුව මතට නැග්ගේ මගේ බිරියගේ සහෝදරියගේ ඝාතනය සම්බන්ධයෙන් සාක්ෂි දීම සඳහායි. පසුගිය දෙසැම්බර් 18 වැනිදා මා පිළිකා රෝහලේ රාජකාරි කටයුතුවල නිරත වී සිටින අතරතුර පෙරවරු 8.30ට පමණ රුවන් මල්ලී (ඝාතනයට ලක්වූ කාන්තාවගේ සොහොයුරා) කෝල් කරලා කීවා, මධුරලාගේ ගෙදරට ඉක්මණට එන්න කියලා, ඊට පස්සෙ මම ඉක්මණට මධුරලාගේ ගෙදරට ආවා. එතකොට වෙලාව පෙරවරු 8.45ට විතර ඇති. මම එනකොට ගෙදර ගොඩක් සෙනඟ පිරිලා හිටියා. ගෙට ඇතුළුවෙනකොටම ඥාති සහෝදරියක් මට කීවා අනේ මල්ලියේ වෙන්න තියෙන දේවල් සේරම දැන් වෙලා ඉවරයි කියලා. මම නංගීගේ කාමරයට ඇතුළුවෙනකොට දැක්කා නංගී ඇඳ උඩ නැතිවෙලා ඉන්නවා. එයාගෙ ළඟම පොඩි බබා හිටියා. ඊට ටිකක් එහායින් ලොකු බබාගේ මළසිරුර තිබුණා. මළසිරුරු වටේට අඟුරු වගේ මොනවද තියෙනවා දැක්කා. ඒ අය පිච්චිලා හිටියේ. ඒක දැක්ක මම කෝ මධුර, කෝ මධුර කියලා කෑගැහුවා''

සහකාර පොලිස් අධිකාරී ජයලත් මහතා :- ''ඔබ මධුර එක්ක ඒ අවස්ථාවේ කතා කළාද?

සාක්ෂිකරු :- ඔහු පොලිසියට කටඋත්තරයක් දීදී හිටපු හින්දා කතා

කරන්න බැරිවුණා. මම අපේ ගෙදරට මේ මරණ ගැන දැනුම් දුන්නා. මධුරලාගෙ ගෙදර පැය 3ක විතර කාලයක් මම ඉන්න අතරතුර මගේ මල්ලිත් ආවා. අපි දෙන්නා කතාවෙලා තීරණය කළා මේ සිද්ධිය මගේ බිරියට නොඅඟවා ඉන්න. ඒ මගේ බිරියට දරුවෙක් හම්බවෙන්න ඉන්න හින්දා. මම එයාව රැකියාව කරපු තැන ඉඳලා මධුරගෙ ගෙදරට එක්කගෙන ආවා. අපි එද්දි මධුරගෙ අම්මා අඬඅඬා හිටියේ. මම අපේ අනිත් බබාව මධුරගේ කාමරයේ තියලා එළියට ආවා. මට මධුරත් එක්ක කතා කරන්න අවස්ථාව ලැබුණේ පස්වරු 7.30ට විතර. මම ඇහුවා මොකක්ද මේ වුණේ මධුර කියලා. එයා කීවා එයාටත් හිතාගන්න බෑ කියලා. ඒත් මට ඉස්සර ඉඳන්ම මධුරත් එක්ක පොඩි ප්‍රශ්නයක් තිබුණා. මම එයාගෙන් ඇහුවා, එක පාරටම ඇයි රස්සාවට යන එක නතර කළේ කියලා. මධු කීවා, ''මාව රස්සාවෙන් අයින් කළේ නෑ, පුද්ගලික ව්‍යාපාරයක් පටන්ගන්න වුණා'' කියලා.

සහකාර පොලිස් අධිකාරී ජයලත් මහතා :- එම පෞද්ගලික ව්‍යාපාරය සම්බන්ධයෙන් ඔහු මොනවද ප්‍රකාශ කළේ?

සාක්ෂිකරු :- පිටරටවලට ඇඳුම් යවන ව්‍යාපාරයක් පටන්ගන්නවා කියලයි කීවෙ. ඒ වගේ ව්‍යාපාරයකින් ලාබ ලැබෙනවද කියලත් මම ඇහුවා.

මේ වෙනකොට මළසිරුරු කළුබොවිල රෝහලට අරගෙන ගිහින් තිබුණේ. මම තීරණය කළා 18 රෑ මධුරලෑ ගෙදර නතරවෙන්න. මධුර, මධුරගෙ අම්මා, අපේ ලොකු නැන්දගෙ පුතෙක් සහ තවත් කීපදෙනෙක් එදා රෑ මධුරලෑ ගෙදර නතර වුණා. මධුරගෙ අම්මා විඩෙන් විඩ ඇඬුවා. අපි එළිවෙනකල් ඇහැරලා හිටියා. පහුවදා පාන්දර පහමාරට විතර මධුර නොසන්සුන්කාරී ආකාරයෙන් අත්දෙක බැඳගෙන එයාගෙ අම්මා වටේ සක්මන් කළා. එයා දුකින් හිටපු නිසා අපි මධුර ගැන අවධානයෙන් හිටියේ. ඒත්

මට මධුර ගැන සැක හිතුනා.

මම රුවන්ව වෙන කාමරයකට එක්කගෙන ගිහින් මධුරගේ අමුතු හැසිරීම ගැන කතා කළා. ඉස්පිරිතාලයේ තිබුණු මළසිරුරු ඉක්මණට ගෙදර අරගෙන එන්න අපි උනන්දු වුණත් මධුරට ඒ තරම් උවමනාවක් තිබුණේ නැහැ. මළසිරුරු ගන්න ඉස්පිරිතාලෙට යන්න ලෑස්ති වෙද්දී අවශ්‍ය වුණොත් කතා කරන්නම් කියලා මට නතරවෙන්න කීවා. මමත් ඉස්පිරිතාලේ වැඩ කරන හින්දා කටයුතු පරක්කු නොකර ඉක්මණට කරගන්න පුළුවන් වෙයි කියලා මම කීවාම, තව ටිකකින් පොලිසිය එක්ක ඉස්පිරිතාලෙට එන්න කියලා මධුර ආයෙ සැරයක් කීවා. පස්සෙ මමත් ඉස්පිරිතාලෙට ගියා. මළසිරුරු අඳුනගන්න මල්ලියි මධුරයි ගියා. මරණ පරීක්ෂණ කටයුතු සිදුකරන අවස්ථාවේ මමයි, මධුරයි, මල්ලියි, මධුරගෙ යාළුවෙකුයි තමයි හිටියෙ.

මධුර එකපාරටම කීවා ''මරණ පරීක්ෂණ කරන්න ඇයි මේ තරම් පරක්කු. මට ඉන්න අමාරුයි. මම කාර් එකට යනවා'' කියලා. ඒ වෙලාවෙත් ඔහු අපහසුතාවයෙන් හිටියෙ.

සහකාර පොලිස් අධිකාරී ජයලත් මහතා :- ''මොන විදියෙ අපහසුතාවක්ද?

සාක්ෂිකරු :- සාමාන්‍ය වෙලාවට තියෙන තැන්පත් බව නැතිවෙලා තිබුණෙ. ඊට පස්සෙ මරණ පරීක්ෂණ කටයුතු සිදුකරන තැන මම මධුරගේ යාළුවත් එක්ක නතරවෙලා මධුරයි මල්ලියි ගෙදර පිටත් කළා. පස්සෙ මට ආරංචි වුණා වැඩිදුර කටඋත්තර ගන්න පොලිසියෙන් මධුරව අරගෙන ගිහින් කියලා.

සහකාර පොලිස් අධිකාරී ජයලත් මහතා :- කවුද කීවෙ?

සාක්ෂිකරු :- මට මතක විදියට මල්ලි. ඔහොම ටික වෙලාවක් අපි ඉස්පිරිතාලෙ ඉන්න අතරතුර පොලිස් නිලධාරියෙක් ඇවිත් කීවා මධුර ඉන්න තත්ත්වය උඩ එයාට මළසිරුරු බාරගන්න බෑ කියලා.

පවුලේ කෙනෙක්ට මිනිය බාරගන්න. උසාවි නියෝගයක් අරගන්න කියලා ඒ නිලධාරියා කිව්වා. ඒ වෙලාවෙ හවස්වෙලා තිබුණ නිසා, උසාවි නියෝගයක් ගන්න බැරිවෙයි කියලා තීරණය කරලා, පහුවදා ඒක ගන්නවා කියලා හිතාගෙන මම ගෙදර ආවා.

සහකාර පොලිස් අධිකාරී ජයලත් මහතා :- මේ මරණ සිදුවෙලා තියෙන්නෙ කොහොමද කියා ඔබ කෙසේද දැනගත්තෙ?

සාක්ෂිකරු :- අපි මේ මරණ ගැන පුදුම වෙලා හිටියෙ. පොලිසියට ගිය අවස්ථාවක ඕ.අයි.සී. මහත්තයා කීවා මේ මරණ සාමාන්‍ය ඒවා නොවේ, මිනීමැරුම් කියලා. ඒවා කරලා තියෙන්නෙ මධුර කියලත් ඕ.අයි.සී. මහත්තයා කීවා. ඒ වගේම ඒ මහත්තයා කීවා, මරණවල අවසන් කටයුතු මධුරලෑ ගෙදර ගන්නෙ නැතිව මහගෙදර ගන්න කියලා. අපි ඒකට කැමැත්ත පළකළා.

සහකාර පොලිස් අධිකාරී ජයලත් මහතා :- උසාවි නියෝගයෙන් කාටද මරණ භාරකරලා තිබුණේ?

සාක්ෂිකරු :- මධුරට බාරගන්න කියලා තමයි තිබුණෙ. නමුත් ඔහු සැකකරුවකු වූ නිසා අපි තමා මිනී බාරගත්තෙ.

සහකාර පොලිස් අධිකාරී ජයලත් මහතා :- මේ අය මරලා තියෙන්නෙ කොහොමද කියලා කෙසේද ඔබ දැනගත්තෙ?

සාක්ෂිකරු :- දෙසැම්බර් 18 වෙනිදා තමයි මම දැනගත්තේ මේක මිනීමැරුමක් කියලා. ඉස්පිරිතාලෙදී වෛද්‍ය වාර්තා දෙන නිලධාරිනිය මාත් සමග කතා කළා. ඇය මට කීවා, මේක සාමාන්‍ය මරණයක් නොවෙයි, මිනීමැරුමක් කියලා. මධුර ගැන සැක මතුවෙලා තියෙන්නෙ, ඒ නිසා මේක මිනීමැරුමක් බව තේරුම්ගන්න කියා ඇය කීවා.

සහකාර පොලිස් අධිකාරී ජයලත් මහතා :- මැරුණේ කොහොමද දන්නවද?

සාක්ෂිකරු :- ඇය කීවා ශ්වසන නාල හිරවෙලා තමයි මේ තුන්දෙනා

මැරිලා තියෙන්නෙ කියලා. චූටි දරුවා මැරිලා තියෙන්නේ දුම වැදිලා. නංගි සහ ලොකු දරුවා නැතිවෙලා තියෙන්නෙ අස්ථි තෙරපීමක් කරලා කඩදා දැමීමෙන් කියලත් කීවා.

සහකාර පොලිස් අධිකාරී ජයලත් මහතා :- මධුර ගැන, මධුරගේ පවුල ගැන මොනවද දැනගෙන හිටියේ?

සාක්ෂිකරු :- මධුරගෙ අම්මා පොලිසියට කියලා තිබුණා, එයා අරන් හදාගත්ත ළමයෙක් කියලා. ඔහු තමයි ඒ පවුලේ හිටිය එකම දරුවා.

සහකාර පොලිස් අධිකාරී ජයලත් මහතා :- මධුර හා බිරිය අතර ආරවුල් තිබුණද?

සාක්ෂිකරු : - කවදාවත් මම දැනගෙන හිටියෙ නෑ ඒ අය අතර ආරවුල් තිබුණා කියලා. මධුරගේ ක්‍රියාකළාපය ගැන අපට සැක හිතුනේ නැහැ. හැමදාමත් ඔහු ගුප්ත නිහඬ ජීවිතයක් ගතකළේ. මස්සිනා අපිත් එක්ක වැඩි ආශ්‍රයක් නැත්තේ ඇයි කියලා මම අවස්ථා කීපයකදීම බිරියගෙන් අහලා තිබුණා. මට වඩා මගේ බිරිය මධුර ගැන දන්නවා. ඒක මධුරගේ සාමාන්‍ය ස්වභාවය කියලා බිරිය මට හේතු පෙන්නුවා. මේ ඝාතන වෙන්න කලින් දවසෙත් මධුරයි, නංගියි දුරකථනයෙන් මටයි බිරියටයි කතා කළා.

සහකාර පොලිස් අධිකාරී ජයලත් මහතා :- මොනවා සම්බන්ධයෙන්ද කතාකළේ?

සාක්ෂිකරු :- යහළුවෙකුගේ ඉඩමක් සම්බන්ධයෙන්.

සහකාර පොලිස් අධිකාරී ජයලත් මහතා :- මධුරගේ පවුල හා ඔබතුමාගේ පවුල අතර ආරවුල් තිබුණද? අම්මලා එක්කවත්?

සාක්ෂිකරු :- මධුරලාගෙ පවුල බොහොම ළඟින් ආශ්‍රය කරනවා. කිසිම ප්‍රශ්නයක් තිබුණෙ නැහැ.

ඉන් අනතුරුව සාක්ෂිකරුගෙන් සාක්ෂි විමසීම අවසන් වූ අතර, ඔහු සාක්ෂි කූඩුවෙන් බැස ගියේය.

සිදුකරන ලද පරීක්ෂණ සම්බන්ධයෙන් අධිකරණය වෙත

කරුණු වාර්තා කළ සහකාර සහකාර පොලිස් අධිකාරී ජයලත් මහතා, ඝාතන සිද්ධීන්ට අදාළව මරණ පරීක්ෂණ සාක්ෂි ලබාගෙන අවසන් බව කීය.

සම්පූර්ණ මරණ පරීක්ෂණ සාක්ෂි සහ මරණ පරීක්ෂණ වාර්තා 3 කඩිනමින් අධිකරණය වෙත යොමුකරන බව දන්වා සිටි සහකාර පොලිස් අධිකාරී ජයලත් මහතා සැකකරු තවදුරටත් රිමාන්ඩ් භාරයේ තබන ලෙස ඉල්ලා සිටියේය.

අගතියට පත් පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි නීතිඥ රන්ජිත් දහනායක මහතා කරුණු දක්වමින් ඝාතනයට ලක්වූ සචේතනා සඳමාලි මහත්මියට අයත් තනි හා බද්ධ බැංකු ගිණුම් කීපයක බැංකු පොත් සහ කාඩ්පත් අතුරුදහන් වී ඇති බව සඳහන් කළේය.

එම ගිණුම්වල ඇති මුදල් වෙනත් පුද්ගලයෙකුට ගැනීමට හැකියාව ඇති බැවින්, බැංකු ගිණුම් සම්බන්ධයෙන් නිසි පියවර ගන්නා ලෙස අදාළ බැංකුවලට නියෝග නිකුත් කරන ලෙස ද නීතිඥ රන්ජිත් දහනායක මහතා ඉල්ලා සිටියේය.

ඉදිරිපත් වූ කරුණු සලකා බැලීමෙන් අනතුරුව නඩු භාණ්ඩ සම්බන්ධයෙන් කඩිනමින් රස පරීක්ෂක වාර්තා කැඳවන ලෙස නොතීසි නිකුත් කළ මහේස්ත්‍රාත්වරිය බැංකු ගිණුම් සම්බන්ධයෙන් පොලිසිය මාර්ගයෙන් දැනුම් දී අවශ්‍ය පියවර ගන්නා ලෙස නියම කළාය.

විජයමුණි මධුර මනුරංග සිල්වා නැමැති මෙම සැකකරු තවදුරටත් ලබන 30 වැනිදා දක්වා රිමාන්ඩ් භාරයේ තැබීමට නියෝග කළ මහේස්ත්‍රාත්වරිය, මරණ පරීක්ෂණ සාක්ෂි වාර්තා සියල්ල එදින කැඳවන ලෙස පොලිසියට නියම කළාය.

සංස්කාරක හිමිගෙන්...

අපගේ මහබෝසතාණන් වහන්සේ විසි අසංඛ්‍ය කල්ප ලක්ෂයක් පුරාවට බුදුබව පතා පිරුවා වූ අප්‍රමාණ පාරමිතාවන්ගෙන් පළමුවන පාරමිතාව වූ දාන පාරමිතාවට හේතු කාරණා වූ තම කුසින් බිහිකළ සුරතල් දරු පැටවුන් දෙදෙනා කුසගින්න නිවා ගැනීම පිණිස ආහාරයට ගැනීමට සූදානම් වූ මව දෙස බලා ''අහෝ සසර දුක, අහෝ සසර බිය මෙවන් දුකින් මිදීමම සැපතකි,යි සිතා ව්‍යාඝ්‍ර දෙනට දිවි පුදා පළමු දාන පාරමිතාව ආරම්භ කළ සේක.

දෙවනු පාරමිතාව වූ බොහෝ බලවත් මහේශාක්‍ය රජකුලයක ඉපිද පස්කම් සැප සම්පත් විඳිමින් රාජ්‍යය කරන කල්හි විනෝදය පිණිස වනාන්තරවල වෙසෙන අලි, ඇතුන් අල්වා හීලෑ කරමින් රාජ්‍යය කරන සමයෙහි ඇත් පාලකයාට එක් දිනක් දන්වා සිටිනුයේ, මා හට උයන් කෙළියට යාම සඳහා සුදුසු හීලෑ ඇතෙක් සූදානම් කරන ලෙස දන්වා සිටි පසු පසු දින ඇත් සේනාවේ සිටි ඉතාම කීකරු හීලෑ ඇතා සූදානම් කර රජතුමාට ඒ බැව් දන්වා සිටියේය.

ඒ අනුව රජතුමාද (අප මහාබෝසතාණන් වහන්සෙ) ඇතා පිට උයන් කෙළියට යන අවස්ථාවේ උයන් සමීපයේ එදින රාත්‍රී වනගත අලින් පැමිණ ගිය පසු එහි සිටි ඇතින්නියන්ගෙ ගඳ ඉව වැටුණු මෙම ඇතාගෙ මද කිපී රජතුමා බිම දමා යාමට නොයෙක් ආකාරයෙන් උත්සාහ කෙසේ හෝ රජතුමා බිම දමා ඇතින්නන් වෙත ගියේය. ඇත් රජාට කාම ගින්නද, මහරජතුමාට කෝප ගින්නද ඇති විය. රාජ මාන්නයට කැළලක් වූවායයි සිතා කෝපයෙන් යුතුව ඇත් පාලකයා රජතුමා ඉදිරියට ගෙන්වා නිදහසට කරුණු විමසීය. එවිට ඇත් පාලකයා කියනුයේ, ''දේවයන් වහන්ස, අපගේ ඇත් සේනාවෙ සිටින හොඳම කීකරු උසස් කුලයෙ ඇතෙකි මොහු

එනමුත් කාම ගින්න නොහොත් රාග ගින්න අති භයානකය හෘද වස්තුවේ ඇණුනු හීයක් හා සමාණය. කිසිවෙකුටත් එය පාලනය කර ගැනීමට පොහැකිය. මෙම ඇත් රජා ඔහුගෙ කාම ගින්න නිවාගත් පසු නැවත ඔහුට දෙන දඬුවම් ගැනවත් නොබලා මෙයින් සත්වන දවසට ඇත්ගාලට ආපසු එන්නේය''යි කී පසු ''එසේ නම් අද සිට හත් දවසක් යනතුරු තොපට කල් දෙමි, එසේ නාවොත් තොපට දිය යුතු දඬුවම් මම දනිමි''යි කීවේය.

මෙසේ ඇත් රජා දින හයක් කාම රතියෙහි යෙදී හත්වන දිනට පහන් වීමට ප්‍රථම කලින් සිටි තැනටම පැමිණ තමාට මොන දඬුවම් දෙයිදෝ නොදනිමින් භයින් ගැහි ගැහී සිටියේය. (ඇත් රජාණන් මෙම ගෞතම බුදු සසුනේ දෙවන බුදුරජාණන් වහන්සේ වූ කාශ්‍යප මහරහතන් වහන්සේය) පසුදා ඇත් පාලක තුමා (මෙතුමා මතු අනාගතේ මෛත්‍රී සම්මා සම්බුදු රජාණන් වහන්සේය) ඇත් ගාලට ගිය පසු අවශ්‍ය කරන ඇතා සිටිනු දැක වහා රජමැදුරට ගොස් රජතුමාට ඒ බැව් දන්වා සිටියේය. එවිට රජතුමාද වහ වහා, ඇත්ගාලට ගොස් බලන විට රජතුමා මට කිනම් දඬුවමක් දෙයිදෝ නොදැන භයින් තැතිගනිමින් සිටියේය.

එවිට රජතුමා ඇත් පාලකයාට කියා සිටියේ 'තොප එදා මට කියා සිටියා මෙම ඇත් සේනාවේ සිටින ඉතාම කීකරු ඇතා බව, මෙම ඇතාගෙ කීකරු බව මට දැන් තොප පෙන්විය යුතු''යයි දන්වා සිටියේය. එවිට ඇත් පාලක තෙමේ වර්තමානයෙ දළදා පෙරහැරේ ගෙන යන කොප්පරා පන්දම් වැනි යකඩ කුරුවලින් සාදන ලද කුඩුවකට ගිණියම් අඟුරු දමා තවතවත් ගිණියම් කර ඇති රජාට නියෝග කරන්නේ ''මෙම ගිණි කබල හොඬවැලෙන් ගෙන මා කියන තෙක් බිම නොදමා තියා ගණුව''යි කී පසු හොඬවැල සිරිසිරි ගා පිළිස්සෙද්දිත් බිම නොදමා වේදනාවෙන් සහ භයින් යුතුව සිටිනු දුටු රජතුමා වහා එය බිම දමව''යි කී පසු බිමට දැම්මේය.

අහෝ කාම රාග ගින්න මෙතරම් භයානකද? මෙතරම් දරුණුද? මෙතරම් වේදනාකාරීද? සසර දුකයි, බයයි වේදනායි, සසරින් මිදීමම සැපයි. මේ දුක් සසර ගමණින් අනෙකුත් සත්වයොත් මුදවා මමත් සසර දුකෙන් මිදෙමි''යි සිතා සියලුම රාජ්‍ය සම්පත් හැර දමා තපස් රැකීම පිණිස වනගත වූ සේක.

ඉහත සඳහන් සිදුවීම වූයේ මෙයට මහා කල්ප විසි අසංඛ්‍යයකට ඉහතදීය. ඒ කරගත්තා වූ අකුසල පාප කර්මයේ විපාක තවමත් ගෙවා නිම නැත. මතු අනාගතයෙහි බුදු බවට පත්වන මෛත්‍රී බුදුරජාණන් වහන්සේගෙ දකුණු ශ්‍රී හස්තයෙ දරසෑයක් මැවී එම දර සෑය තුළ කාශ්‍යප මහ රහතන් වහන්සේගෙ ශ්‍රී දේහය ආදාහනය වන්නේය. ඉන්පසු එම අග්නි ජාලාවෙන් අල්ල පිළිස්සී දිය පට්ටයක් සෑදී එය අසාධ්‍ය තත්ත්වයට පැමිණ එයින්ම පිරිනිවන් පානා සේක. ඇත් රජුට දුන් වේදනාවේ විපාකයකි.

ප්‍රඥාවන්තයො, ඥානවන්තයො, පින්වන්තයො, වාසනාවන්තයො, මේවා තේරුම් ගනිති. එයින් ප්‍රයෝජන ගනිති. සතර අපායන්ගෙන් මිදෙති. දෙව් මිනිස් සැප කෙළවර අමාමහ නිවන් සැප ලබති. අන් අයටත් ආදර්ශමත් වෙති. පඤ්ච ශීලය ආරක්ෂා කරගනිති. රස තෘෂ්ණාවට යොමු නොවෙති. එහි අනිටු විපාක දනිති. කාලයෙන් කාලයට සසර අනන්ත අප්‍රමාණ දීර්ඝ කාලාන්තරයන් පුරා පාරමිතා ධර්මයන් සපුරා බුදුබවට පත්වන උත්තමයන් වහන්සේලා ආරම්භයක් අවසානයක් නොපෙනෙන සසර දුක්විඳින සත්වයන්ගෙන් හැකි පමණ කොටසකුත් දුකින් මුදවා තමන් වහන්සේද දුකින් මිදීම පිණිස දේශනා කරන ධර්මය මිස අන් කවර ආකාරයකින්වත් මිදීමක් නැත.

එවන් ධර්මයක් ලොව පවතින මෙවන් කාලයක අප ජීවත්වන මේ මහපොළොව නොඋසුලන්නා වූ බලලෝභය,

ආත්මාර්ථකාමිත්වය පතා රැස්කරගනු ලබන්නා වූ පාපකර්මයන්ගෙන් අජරාමරයව ජීවත්වන්නේ කොපමණ කාලයකටද? එය තේරුම් ගැනීමට බැරි මිනිසුනේ කුමට ජීවත්වන්නේ ඉහත සඳහන් දෙවන පාරමිතාව වූ ඇත් රජුගේ මද කිපීමේ සිද්ධියම මූල්කරගෙන සසරට සාපකර සියලු රාජ සම්පත් හැරදමා වනගතවූයේ යතාර්ථය අවබෝධ කරගත් නිසාය.

මෙම දහම් ග්‍රන්ථයේ මුල් පිටකවරයෙහි සහ අග පිටකවරයෙහි සඳහන් ඡායාරූප බලන්න. එකී මවත්, දරුවාත් (සීවලී මහරහතන් වහන්සේ සහ මව උපමාවට ගන්න) අනන්ත අතීත භවයකදී කාට හෝ කරන ලද පාප කර්මයක් වෙනුවෙන් සතර අපා අටමහ නරකාදිවල මෙතෙකැයි කිව නොහැකි කාලාන්තරයක් දුක් විඳ පෙර පින් බලයෙන් මිනිසත් ආත්ම භාවයක් ලබාගත්තත් අකුසල විපාකය මේ ආත්මය මෙන් තව ඉදිරියට කොපමණ ආත්ම භාවයන්හිදී විඳවන්නට වේදැයි දන්නේ බුදුරජාණන් වහන්සේ නමක් පමණයි

එය උපමාවකින් පෙන්වනවා නම් (ගින්නෙන්) අපේ ලංකාවේ එක් ඇමතිවරයෙක් කාමයෙහි වරදවා හැසිරීම දැනගත් තම ඇමති බිරිඳ එකී කාන්තාවගේ ශරීරයට ඉන්ධන දමා පුළුස්සා මරා රාජදඬුවම වශයෙන් මරණීය දඬුවම ලැබ දේශපාලන බලයෙන් දඬුවමෙන් මිදුනත් මරණින් මතු අතරමග නැවතීමක් නැතිව මෙතැකැයි කිව නොහැකි කාලයක් අටමහ නිරයන්හි අපමණ දුක් වේදනා විඳවන්නේය. එමදුක් කෙළවර ශේෂ විපාක වශයෙනුත් මෙතෙකැයි කිව නොහැකි වාරගණන් මිනිසත් ආත්ම ලැබූවත් මෙහි සඳහන් ඡායාරූපයෙ මව පුතු සේම ගින්නෙන් මරණයට පත්වන වාර ගණන් දන්නේ බුදුරජාණන් වහන්සේ නමක් පමණයි. එකී ඇමතියාටද කාමයෙහි වරදවා හැසිරීමේ පාපකර්ම විපාකයෙන් මිදීමක්ද නැත.

එසේම බුදු දහමට ගරු නොකිරීමේ විපාක වශයෙන්ද පඤ්ච සීලය කඩකිරීමේ විපාක වශයෙන්ද අගපිටකවරයෙහි සිටින අපරාධකරු පාණාදිපාතා තදපාමින් වේරමණී සිල්පදය බිඳීමේ විපාක වශයෙන් අටමහ නිරයන්ගෙන් දරුණුම දීඝීකාලීන දුක්දෙන අවීචි මහ නිරයෙහි උපදින්නේය. එසේම දෙවන සිල්පදය වන අදින්නාදාණා වේරමණී සිල්පදය බිඳීමේ විපාක වශයෙන් රෞරය, මහා රෞරවය යන නිරයන් දෙක්හි අති දීඝීකාලීනව දරුණු දුක් විඳින්නේය. (අන් සතු කාන්තාවන් අයිති කරගැනීම තවද සිතෙන්, කයෙන්, වචනයෙන් කාමේසු මිච්ඡාචාරා වේරමණී සිල්පදය බිඳීමේ විපාක වශයෙහි ලෝකුඹු නිරයෙහිද කටු ඉඹුල් නිරයෙහිද අනන්ත විපාක විඳවන්නේය. තවද මුසාවාදා වේරමණී සිල්පදය බිඳීමේ විපාක වශයෙන් සෙසු නිරයන්හිද විඳවන්නේය.

සුළු මොහොතක ආස්වාදයක් පතා කරගත් විනාශය නුවණින් බලන්න. තවද මෙකී සිල්පද හතරම කඩපු කෙනෙකුට පස්වන සිල්පදය වන, සුරාමේරය මජ්ජපමා දට්ඨාණා වේරමණී සික්ඛාපදම් සමාදියාමි සිල්පදය ආරක්ෂා වේද? එක පහත් නොහොඹිනා ක්‍රියාවක් නිසා කරගත් විපත මව සහ පුතු සහ ඇමති බිරිඳගෙන් ගින්නෙන් මැරුම් කෑ කාන්තාවද පෙර ආත්ම භාවයකදී කරගත් අකුශල කර්ම ගෙවන අතර සතර අපා අටමහා නිරයෙන් හිස් නොවීම සඳහා තවත් අය ගෙවන අකුශල කර්ම වෙනුවට ඔවුන් අකුශල කර්ම රැස්කර ගන්නේය.

මේ සැවොම බුදු සසුනක් පවතින කාල වකවානුවක ඉපදීත් බුද්ධ ධර්මය අවබෝධ කරගැනීමේ වාසනාවක් නැත්තේ ධර්මය කෙරෙහි විචිකිච්ඡාව තිබෙන නිසාය. ධර්මය අවබෝධ කරගැනීමට විශාල පුණ්‍ය බලයක් තිබිය යුතුය. එම ශක්තිය බලය ලබාගැනීම සඳහා මුලින් සඳහන් කළ ආකාරයට බුඬ, ධම්ම, සංඝ රත්නය කෙරෙහි ගෞරවය තිබිය යුතුය. නිති පන්සිල් රැකිය යුතු. දස කුසල්

ධර්මයෙහි පිළිපැදිය යුතු. නොකට යුතු වෙළඳාම් නොකළ යුතු. මව්, පිය, වැඩිහිටි ගෞරවය තිබිය යුතු. අඩු, දරුවන් දැහැමින් සාධාරණව උපයා සපයා ගන්නා වස්තුවෙන් පෝෂණය කළ යුතු. පොහොය දිනයන්හි සිල් සමාදන් විය යුතු. එසේ නොහැකි අය සිල්සමාදන් වන අයට උපස්ථාන කළ යුතු. පූජණීය ස්ථානවල කළයුතු කායර්යයන් කළ යුතු. මහා මංගල සූත්‍රය සඳහන් මංගල කාරණා 38න් 12ක්වත් පිළිපැදිය යුතු.

එසේම පින් දහම් කිරීමෙන් පසු මළ ගිය ඥාතීන්ට පින් අනුමෝදන් කළ යුතු. එසේම අල්පෙ ශාක්‍ය දෙවියන්ට, භූතයන්ට, සත්වයන්ට පින් අනුමෝදන් කළ යුතු. එසේම ලෝකපාලක දෙවියන්ට, ශාසන ආරක්ෂක දෙවියන්ට, තමන් ආරක්ෂා කරන්නා වූ ඉෂ්ට දේවතාවන්ට පින් අනුමෝදන් කළ යුතු. එවිට එම පින් අනුමෝදන් වන ඇසට නොපෙනෙන බලවේගයන් විසින් අගපිටකවරයේ සිටින පුද්ගලයාට මෙන් ඔවැනි මෝඩ ගොන් තකතීරු වැඩ කරන්න දෙන්නේ නැත. ඔහුට මෙලොව යම්තාක් කල් ජීවත්වෙයිද, ඒ තාක් කල් අදට වඩා හෙට පශ්චාප්තාප වන්නේය. මෙලොව වශයෙන් ඔහු දෙපස සිටින මහත්වරුන් දෙදෙනා සියුම් දෑතින් ශරීරයට අත තබාගෙන යන මුත් මරණින් මතු බැලුවත් බිය උපදවන යමපල්ලන් ගිනියම් වූ අවි ආයුධවලින් කැපුම් තුවාල ඇනුම් තුවාල සහ බිහිසුනු දශීණයෙන් ශබ්දයෙන් යුතු මෙලොව ගව ඝාතකයින් උපමා වශයෙන් සිතාගත යුතු.

කවදා නමුත් 136ක් නිරයන්ගෙන් බිඳී නැවත තිරිසන් ආත්ම භාවයන්හි මෙතෙකැයි කාල සීමාවක් නැතිව දුක් විඳ මිනිසත් ආත්ම භාවයක් ලත් කල්හි අකල් මරණයට (ගින්නෙන්) ගොදුරුවන්නෙ බාල දරුවාගේ වයස්වල කර්ම විපාක අවසන් කර දෙවන දරුවාගෙ කර්ම විපාක අවසන් කර බිරිඳගෙ වයස් දක්වා ජීවත්ව සිට ගින්නෙන් පමණක් මරණ නිවන් දකින තුරා විඳවන්නට සිදුවේ. එසේම නිවන

දක්වාම ආදරබර බිරිඳක් නොලැබේ. එසේම දරු සම්පතක් නොලැබේ. එසේම වදක භාර්‍යා, චෝර භාර්‍යාවන් සහ ගණිකාවන් පමණක් ලැබේ. එසේම ඔහු උපදින උපදින ආත්මයක් පාසා පිය සෙනෙහසක් නොලබයි. මවගෙ සෙනෙහස ඉහත සඳහන් භාර්‍යාවන් තුන්දෙනා අනුව සිතාගත යුතු. වීදි දරුවෙක් බවට පත්වේ. මේ සඳහන් කළේ එම මවත් දරුවන් දෙදෙනාත් මරාදැමීමට සහ නිදොස් වීමට සිතින්, කයින්, වචනයෙන් කරගත් අකුසල විපාකයට පමණයි.

ඔවන් කාලකන්නි අකුසල පාපකාරී සසර සැරිසරන දුක්ඛිත සත්වයන් දුකින් මිදීමටත් අපටත් මුල් පාරමිතා දෙකෙන් පෙන්වා දෙන ආකාරයට අහෝ සසර දුකයි, අහෝ සසර බියයි, සසරින් මිදීමම සැපයි, මොහොතකුදු හෝ සසර රැඳීමම භයානකයි. අපටත් සසර රැඳීම ඔවන් පාපකර්මයන්ට හසුනොවෙතැයි කියා සිතන්න පුළුවන්ද? එම නිසා බුදු, පසේබුදු, මහරහත් උත්තමයන් වහන්සේලා හොඳයි කියා පෙන්වා වදාළ නිවණට ළඟාවීම පිණිසම දස පුණ්‍ය ක්‍රියාවල යෙදෙන්න.

මීට මෙතැති,

පූජ්‍ය අකුරෙගොඩ රතනසාර හිමි

ධාතු අන්තර්ධානය

''ඒ ඒ තන්හි සත්කාර සම්මාන නොලබන ධාතු බුදුරජාණන් වහන්සේගේ අධිෂ්ඨාන බලයෙන් සත්කාර සම්මාන ලබන තැනට වඩිති. කල් යත් යත් හැම තන්හි සත්කාර සම්මාන නොවේ. එකල්හි මෙලක්දිව ධාතුහු රැස්ව රුවන් ධාගැබට වඩිති. එයින් මහ බෝමඩට වඩිති. නා ලොවිනුදු දෙව් ලොවිනුදු ධාතුහු වඩිති. සර්පයක් පමණ ධාතුයෙකුදු නොතැන නොනස්සි. සර්ව ධාතුහු මහා බෝධි පර්යන්තයෙහි රාශිභූත වූවාහු බුදු වෙස් ගෙන දෙතිස් මහා පුරිස් ලකුණෙන් අසූ අනූ ව්‍යංජනයෙන් ව්‍යාම ප්‍රභායෙන් පරිපූර්ණ වැ බෝ මැඩ පලක් බැඳ බුදුරජාණන් වහන්සේගේ ශරීර ශෝබා දක්වා යමා මහ පෙළහරයෙහි සෙයින් ප්‍රාතිහාර්ය කොට සවණක් රැස් විහිද දස දහස් ලෝධාහි පතුරුවති. එතනට යන මිනිස්සු නැති. දස දහසක් සක්වල දෙව් බඹුහු රැස්ව ''අද බුදු පිරිනිවෙති.'' මේ අපගේ පශ්චිම දර්ශනයැ. මෙ තැන පටන් ගෙන මුළු ලෝ කාන්දකාර වේය යි බුදුරජාණන් වහන්සේ පිරිනිව් දවසට වඩා මහත් කාරුණ්‍යයෙන් වහස්ති අනාගාමින් හා ක්ෂිණාශ්‍රවයන් මිස අවශිෂ්ටයො ස්වභාවයෙන් සිටිනට අසමර්ථයො යි.

ධාතු ශරීරයෙන් තේජොධාතු උද්ගතවැ යාවත් බ්‍රහ්ම ලෝක දක්වා නැගෙයි. සපයක් පමණ ධාතු යෙකුදු ඇති කලැ ඒකාකාරයෙන් සිට දිළිසෙයි. ධාතුන් හැම පර්යාවසානයට ගිය කල්හි ඒවල උච්ඡන්න වෙයි. මෙසේ මහත් ආනුභාව දක්වා ධාතුහු අන්තර්හිත වෙති. එකල්හි දෙව් බඹහු බුදුන් පිරිනිව් දවස් සෙයින් දිව ගඳ මලින් තූර්ය ඝෝෂයෙන් පුදා තුන්යලක් පැදකුණු කොට වැඳ 'අනායෙහි උපදනා බුදුන් දක්මෝ' යි කියා තමන්ගේ වසස්ථානයට යෙත්

(ධර්ම ප්‍රදීපිකාව 418 පිටුව)

සිංහල බෞද්ධයා 24-05-1994

සිය බිරිඳ සහ දරු දෙදෙනා ඝාතනය කිරීමේ සිද්ධියේ සැකකරු වන විජයමුණි මධුරංග ද සිල්වා නමැත්තා ඊයේ (01) ගල්කිස්ස අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසුව යළිත් රිමාන්ඩ් බන්ධනාගාරය වෙත ගෙන යනු ලැබූ අවස්ථාව...

මුද්‍රණය : තිරසවි ප්‍රින්ටර්ස් 0112 569192, 077 9620359